ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

**ඉන්දිය මහ කොමසාරිස්තුමා දකුණු පළාත සඳහා ආධාර ලබා දේ**

ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා 2025 සැප්තැම්බර් 24-25 දිනවල ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ සංචාරයක නිරත විය. එතුමා සැප්තැම්බර් 24 වන දින හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහලේ බාහිර රෝගී අංශයේදී RO ජල පිරිපහදුකරණ ඒකකයක් විවෘත කළේය. ඉන්දිය රජය විසින් පරිත්‍යාග කරන ලද මෙම ජල පිරිපහදුකරණ ඒකකය දෛනිකව රෝගීන්, අමුත්තන් සහ රෝහල් කාර්ය මණ්ඩලය ඇතුළු 1000ක පමණ පිරිසකගේ පිරිසිදු පානීය ජල අවශ්‍යතාවය සපුරාලනු ඇත. හම්බන්තොට නගරාධිපතිතුමා සහ උප නගරාධිපතිතුමා ද මෙම අවස්ථාවට එක් වූහ.

2. සැප්තැම්බර් 25 වන දින මහ කොමසාරිස්තුමා විශිෂ්ඨ ලී කැටයම් සහ පෞරාණික කලා නිර්මාණ රැසකින් සමන්විත අම්බලන්ගොඩ ශ්‍රී විජයාරාම පුරාණ විහාරය වැඳ පුදා ගත් අතර එහිදී එතුමා විහාර පරිශ්‍රය තුළ ඇව බුද්ධ ප්‍රතිමා 80ක් ස්ථාපනය කිරීමේ කටයුතු සම්පූර්ණ කර ගැනීම සඳහා මූල්‍යාධාර පිරිනැමීය.

3. මහ කොමසාරිස්තුමා හම්බන්තොට ඉන්දියානු කොන්සියුලර් ජනරාල් කාර්යාලය සහ දකුණු පළාත් සභාව විසින් විහාර පරිශ්‍රයේ සංවිධානය කරන ලද ආයුර්වේද කඳවුරක් ද විවෘත කළේය. මෑතක දී ඉන්දිය රජය විසින් සමරන ලද දස වන ආයුර්වේද දිනය නිමිත්තතේ සංවිධානය කරන ලද මෙම කඳවුර තුළින් ප්‍රදේශයේ ජනතාවට නොමිලේ වෛද්‍ය පරීක්ෂණ කර ගැනීමට ද, විශේෂඥ වෛද්‍යවරුන් හමු වීමට සහ ඖෂධ ලබා ගැනීමට ද අවකාශ සලසා තිබිණ.

4. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව විසින් බෙදා හදා ගන්නා බෞද්ධ උරුමය සිහි කරමින් මහ කොමසාරිස්තුමා දික්වැල්ල වැවුරුකන්නල බුදුරාජ මහා විහාරය සහ මාතර පරවි දූව විහාරය ද වැඳ පුදා ගත්තේය.

5. මෙම සංචාරය ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ දකුණු පළාත සමඟ සබඳතා ශක්තිමත් කරගැනීමට දරනු ලබන ප්‍රයත්නයන්හි කොටසකි. සැප්තැම්බර් මස මුලදී නියෝජ්‍ය ඉන්දීය මහ කොමසාරිස් වෛද්‍ය සත්‍යාංජල් පාණ්ඩේ මහතා ද දකුණු පළාතේ සංචාරයක නිරත වූ අතර දකුණු පළාත්

ආණ්ඩුකාරතුමා, පළාතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ රුහුණු විශ්ව විද්‍යාලයේ උප කුලපතිතුමා ඇතුළු බොහෝ දෙනා සමඟ අන්තර් ක්‍රියා කළේය.

6. පළාත තුළ ක්‍රියාත්මක කර ඇති සහ දැනට ක්‍රියාත්මක ඉන්දියාවේ වැදගත් සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතීන් අතරට රුහුණු විශ්ව විද්‍යාලයේ ආසන 1500ක ධාරිතාවයකින් සමන්විත රබීන්ද්‍රනාත් තාගෝර් ශ්‍රවණාගාරය, පාසල් 200ක සුහුරු පන්ති කාමර සහ පරිගණක විද්‍යාගාර ස්ථාපනය කිරීම, සහ ප්‍රතිලාභීන් 1000ක් පමණ ආවරණය කරන 'ග්‍රාම් ශක්ති' නිවාස ව්‍යාපෘතීන් දෙකක් යනාදිය ද ඇතුළත් වේ.

***

**කොළඹ**
***2025** සැප්තැම්බර් **26***